ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළි බඳ සහතික පත්‍ර වැඩසටහන **2017/2018**

අවසාන පරීක්ෂණය

**EPC1239/ESC1139-** පෙරපාසල් සංවිධානය හා නිවස සහ පාසල අතර සම්බන්ධතාව

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - **2019.06.15** වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසින් තෝරාගත් ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "පෙරපාසල් කළමනාකරණය" යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න.

02. පෙරපාසල් ගොඩනැගිල්ලක තිබිය යුතු මූලික අංග පහක් (05) ලැයිස්තු ගත කරන්න.

03. ඔබේ පෙරපාසල් භූමියේ පෙරපාසල් දරුවන් රැගෙන යාහැකි ඉගෙනුම් ස්ථාන පහක් (05) නම් කරන්න.

04. පෙරපාසලක් සඳහා එක් දිනකට ඔබ සැලසුම් කරන පොදු ක්‍රියාකාරකම් තුනක් (03) සඳහන් කරන්න.

05. පෙරපාසලක පෙරපාසල් ගුරුවරයා විසින් සැලසුම් කර තිබෙන ක්‍රියාකාරකම් සඳහා දෙමාපියන්ගේ සහභාගිත්වයේ ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

06. පෙරපාසලක දරුවන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන වාර්තා වර්ග තුනක් (03) ලියන්න.

07. පෙරපාසලක "වැලි වළ" හි ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

08. පෙරපාසලක ගෘහස්ථ ඉගෙනුම් පරිසරය ඔබ සැලසුම් කරන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. i. පෙරපාසලක 'සති සැලැස්මක්' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

ii. පෙරපාසලක දෛනික ක්‍රියාකාරකම් ඔබ සැලසුම් කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. පෙරපාසලක සති සැලසුම් තබා ගැනීමේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10 'පෙරපාසල් ගුරුවරයා පෙරපාසල තුළ ළමුන්ගේ ආරක්ෂාව සහ රැකවරණය පිළිබඳව සහතික විය යුතුය.' (ලකුණු 10)

i. 'ආරක්ෂාව' සහ 'රැකවරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 10)

ii. ඉහත දැක්වෙන වගන්තියට අනුව පෙරපාසල තුළ ආරක්ෂාව හා රැකවරණය සම්බන්ධයෙන් ගුරුවරයාගේ භූමිකාව කුමක් ද? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. i. වයස අවුරුදු 2-5 අතර වයස් කාණ්ඩයේ සිටින දරුවන් සඳහා උචිත දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් සැලසුම් කරන්නේ කෙසේද යන්න විස්තර කරන්න. (ලකුණු 10)

ii. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක පාලිකාවගේ ප්‍රධාන වගකීම් මොනවාදැයි සුදුසු උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. i. ඔබේ පෙරපාසලට ඇතුලත් කර ගැනීමට තෝරා ගනු ලැබූ දරුවන්ගේ දෙමාපියන් සඳහා පළමු දින හමුවීම සංවිධානය කරන්නේ කෙසේද යන්න විස්තර කරන්න. (ලකුණු 08)

ii. දෙමාපියන් හමුවන මුල්ම දිනයේ ඔබ කතාකිරීමට බලාපොරොත්තු වන ප්‍රධාන කරුණු පහක් **(05)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

iii. ඔබ ඉහත සඳහන් කළ එක් ප්‍රධාන කරුණක් පිළිබඳව විස්තරයක් ලියන්න. (ලකුණු 07)

13. i. පන්තිකාමරයක පෙරපාසල් දරුවන් කණ්ඩායම් කිරීමේ දී සැලකිල්ලට ගතයුතු සාධක හතරක් **(04)** පැහැදිලි කරන්න.

ii. "අපට පෙනෙන අහස" යන තේමාව යටතේ කණ්ඩායම් ඉගැන්වීමක් සඳහා ක්‍රියාකාරකමක් යෝජනා කර එය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඉදිරිපත් කරන්නේ කෙසේදැයි උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.